වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
**Department of Trade and Investment Policy**

මහලේකම් කාර්යාලය, කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo - 01

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
**Ministry of Finance**

මගේ අංකය / எனது இல. / My No. TIP/TP/01/10(173)

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2022 .03.09

රජයේ මුද්‍රණාලයාධිපති,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

මහත්මියණි,

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

ගරු මුදල් අමාත්‍යතුමා විසින් පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය 2022.03.09 දිනැති අංක 2270/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමඟ එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 450 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

- ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
- ලේකම්, වෙළඳ අමාත්‍යාංශය
- රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමඟ එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව- ඔබගේ දැනගැනීම සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව- වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව- වෙබ් පිටුවේ පළකිරීම සඳහා

දුරකථන අංකය / தொலைபேசி / Telephone 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax 0112 484 962, 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.treasury.gov

**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**2 වැනි වගන්තිය යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ (i) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (ii) වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2022 මාර්තු මස ......10.......... දින සිට ආරම්භ වන මාස 06 කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ පනවන ලද 2021 අගෝස්තු මස 11 දිනැති අංක 2240/20 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් වෙඩරු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (රේගු සංකේත අංක 0405.10, 0405.20, 0405.90), 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2021 ජූලි මස 18 දිනැති අංක 2236/66 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් කේජු (රේගු සංකේත අංක 0406.20), 2021 මැයි මස 17 දිනැති අංක 2228/3 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් යෝගට් (0403.10, 0403.20) රට ඉඳි (රේගු සංකේත අංක 0804.10.10, 0804.10.20), අළුත් දොඩම් (රේගු සංකේත අංක 080510.10) මිදි (රේගු සංකේත අංක 0806.10,0806.20 ) ඇපල් (රේගු සංකේත අංක 0808.10 ) සහ 2021 අප්‍රේල් මස 26 දිනැති අංක 2225/1 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් අනෙකුත් පළතුරු (රේගු සංකේත අංක 0810.90.90) සඳහා ප්‍රකාශිත නියමය 2022 මාර්තු මස ......10.............වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

බැසිල් රාජපක්ෂ

**මුදල් අමාත්‍ය**

2022 මාර්තු මස .........09..... වන දින

කොළඹ 01,

මුදල් අමාත්‍යාංශයේදිය.

## උපලේඛනය

| (i) වන තීරය | | | | (ii) වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1. | 04.03 | 0403.10 | යෝගට් | කි. ග්‍රෑමයට රු 1000/- |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු 1000/- |
| 02 | 04.05 | 0405.10 | වෙඩරු | කි.ග්‍රෑමයට රු1000/- |
| | | 0405.20 | කිරි වලින් නිපදවූ තැවරුම් | කි.ග්‍රෑමයට රු1000/- |
| | | 0405.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු1000/- |
| 03 | 04.06 | 0406.20 | සියළුම වර්ගවල පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි.ග්‍රෑමයට රු 400/- |
| 04 | 08.04 | 0804.10.10 | රට ඉඳි - අළුත් | කි. ග්‍රෑමයට රු 200/- |
| | | 0804.10.20 | රට ඉඳි - වියළි | කි. ග්‍රෑමයට රු 200/- |
| 05 | 08.05 | 0805.10.10 | දොඩම්- අළුත් | කි. ග්‍රෑමයට රු 200/- |
| 06 | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි. ග්‍රෑමයට රු 300/- |
| 07 | | 0806.20 | මිදි - වියළි | කි. ග්‍රෑමයට රු 300/- |
| 08 | 08.08 | 0808.10 | ඇපල් | කි. ග්‍රෑමයට රු 300/- |
| 09 | 08.10 | 0810.90.90 | අනෙකුත්(පළතුරු) | කි.ග්‍රෑමයට රු 300/- |

## SCHEDULE

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Item | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S .Code | Description | |
| 1 | 04.03 | 0403.10 | Yogurt | Rs. 1000 per kg |
| | | 0403.90 | Other | Rs. 1000 per kg |
| 2 | 04.05 | 0405.10 | Butter | Rs. 1000 per kg |
| | | 0405.20 | Dairy spreads | Rs. 1000 per kg |
| | | 0405.90 | Other | Rs. 1000 per kg |
| 3 | 04.06 | 0406.20 | Grated or powdered cheese of all kinds | Rs.400 per Kg |
| 4 | 08.04 | 0804.10.10 | Dates –Fresh | Rs.200 per kg |
| | | 0804.10.20 | Dates – Dried | Rs.200 per kg |
| 5 | 08.05 | 0805.10.10 | Oranges - Fresh | Rs.200 per Kg |
| 6 | 08.06 | 0806.10 | Grapes - Fresh | Rs. 300 per Kg |
| 7 | | 0806.20 | Grapes -Dried | Rs. 300 per Kg |
| 8 | 08.08 | 0808.10 | Apples | Rs. 300 per Kg |
| 9 | 08.10 | 0810.90.90 | Other - fruits | Rs. 300 per Kg |